*සැ. යු.*- 2022.09.23 දින පළ වූ අංක 2,299 දරන *ගැසට් පත්‍රයේ* I/II (අ) සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,300 - 2022 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2022.09.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1524 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ඔක්තෝබර් මස 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ඔක්තෝබර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1523 - B 082387— 5,403 (2022/09)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමට දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය.
(ii) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.
(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු යි.
(iv) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතු ය.

02. *තෝරා ගැනීමේ ක්‍රමය* :

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන (රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ද ඇතුළත්ව) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, අනුමත කරන ලද ලකුණු පරිපාටියකට අනුව ලකුණු පිරිනමා, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

***සටහන*** : සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතු ය.

03. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර **2022.10.14** වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය) ''ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම'' යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ. (ආදර්ශ අයදුම්පත්‍ර www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කරගත හැකි ය)

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී. ඒ. ඩී. ඩබ්ලිව්. දයානන්ද,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්‍රය

"අ'' කොටස

1. 1.1 මුල'කුරු සමඟ නම :——————. මයා/මිය/මෙනවිය
   1.2 සම්පූර්ණ නම (සිංහලෙන්) :——————. මයා/මිය/මෙනවිය
   (ඉංග්‍රීසියෙන්) :——————.
   1.3 නම (පත්වීම් ලිපියේ සඳහන් ආකාරයට) :——————.

2. 2.1 උපන් දිනය :- අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

   2.2 වයස (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට) ඃ අවුරුදු :————. මාස :————. දින :————.

   2.3 ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

3. ලිපිනයන් ඃ

   3.1 රාජකාරි ලිපිනය :——————.
   3.2 රාජකාරි දුරකථන අංකය :——————.
   3.3 ස්ථිර ලිපිනය :——————.
   3.4 පෞද්ගලික දුරකථන අංකය :- ස්ථාවර :——————. ජංගම :——————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

5. ශ්‍රී. ලං. අ. ප. සේවයට පත්වීමේ ස්වභාවය :——————.
   (විවෘත/සීමිත/ජ්‍යෙෂ්ඨ කුසලතා/වෙනත් පදනම මත)

6. ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස් වූ දිනය :——————.

7. දැනට දරණ තනතුර හා සේවා ස්ථානය :——————.

8. අධ්‍යාපන සුදුසුකම් (උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා/පශ්චාත් උපාධි/දර්ශනපති උපාධි/දර්ශනශූරී උපාධි) ඃ

| අනු. අංකය | උපාධිය/ ඩිප්ලෝමාව/පශ්චාත් උපාධිය/ දර්ශනපති උපාධිය/දර්ශනශූරී උපාධිය | ලබාදුන් ආයතනය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. සේවා පළපුරුද්ද ඃ
(ශ්‍රී.ලං.අ.ප.සේ. මුල් පත්වීමේ සිට මේ දක්වා තොරතුරු ඇතුළත් කරන්න)

| තනතුර | තනතුර අයත් ශ්‍රේණිය | කාල සීමාව | | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

ඉහත සඳහන් කළ තොරතුරු නිවැරදි බවත්, පසුගිය අවුරුදු පහ (05) ඇතුළත දී නියමිත වැටුප් වර්ධක මවිසින් උපයා ගෙන ඇති බවත්, කිසිදු විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් සහතික කරමි.

. ________, ________,
දිනය අයදුම්කරුගේ අත්සන

---

"ආ'' කොටස

අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව භාර ආසන්නතම මාණ්ඩලික නිලධාරියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන................................................................................................................ මයා/මිය/මෙනවිය

1. අංක 1 සිට 9 දක්වා ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි/ වැරදි වේ.

2. ශ්‍රී. ලං.අ.ප.සේ.1 ශ්‍රේණියට උසස්වීම් ලද ................................... දින සිට ................................. දින දක්වා අඩ වැටුප්/වැටුප් රහිත නිවාඩු ලබා ඇත. / නැත.
එසේ අඩ වැටුප් /වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු

| කාලය | අඩ වැටුප් නිවාඩු | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|
| ................සිට .................. දක්වා | ................සිට .................. දක්වා | ................සිට .................. දක්වා |
| ................සිට .................. දක්වා | ................සිට .................. දක්වා | ................සිට .................. දක්වා |
| ................සිට .................. දක්වා | ................සිට .................. දක්වා | ................සිට .................. දක්වා |

3. පූර්වාසන්න වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත./නැත
වැටුප් වර්ධක විලම්භනය කර ඇත්නම් එසේ කිරීමට හේතු ඃ

| විලම්භන කාලය | හේතුව |
|---|---|
| ................සිට .................. දක්වා | |
| ................සිට .................. දක්වා | |
| ................සිට .................. දක්වා | |

4. පූර්වාසන්න වසර 05 තුළ විනය විගණන හෝ විමර්ශන ඇත. / නැත .
එසේ විනය විගණන හෝ විමර්ශන ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු

| වර්ෂය | විනය*/විගණන*/විමර්ශන ද යන්න | එහි වත්මන් තත්ත්වය |
|---|---|---|
| | | |
| | | |
| | | |

(**චෝදනා පත්‍ර/ විනය නියෝග නිකුත් කර ඇත්නම් ඒවායෙහි සහතික කරන ලද පිටපත් ඇමිණීම අනිවාර්ය වේ.)

5. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා ඇත/ නැත.

6. නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් යටතේ වන අවශ්‍යතාවයන් සපුරා ඇත./ නැත.

7. උසාවියකින් දඬුවම් ලබා ඇත./නැත.

________,
දිනය

________,
අත්සන
නම :
නිල මුද්‍රාව

"ඇ'' කොටස

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත සඳහන් තොරතුරු ඉදිරිපත් කර ඇති ................................................................. නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනුව පරීක්ෂා කර බැලූ බවත් ඒ අනුව එම තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර මෙම නිලධාරියා/නිලධාරිනිය විසින් 2022 ................... දිනට පූර්වාසන්න පස් වසරක කාලසීමාව තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත් කිසිදු විනයානුකූල දඬුවමකට ලක් නොවූ බවත්, මෙම අයට විරුද්ධව යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් හා ඉදිරියේ දී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවත් සහතික කරමි. නිලධාරියා/නිලධාරිනිය තෝරා ගනු ලැබුවහොත් නිදහස් කිරීමට එකඟ වෙමි.

. ________,
දිනය

________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
නම :
නිල මුද්‍රාව

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :

________,
දිනය

________,
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන
නම :
නිල මුද්‍රාව

පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය : (පළාත් සභාවට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් සඳහා පමණි)

________,
දිනය

________,
පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන
නම :
නිල මුද්‍රාව

09-371

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.